දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. ..........................................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය',
බත්තරමුල්ල
'இசுருபாய' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No.: ඊඩී/1/15/2/2/100

දිනය / திகதி / Date: 2006.03.18

**චක්‍රලේඛ අංක : 2006/04**

සියළුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත.

## පාසල් උදෑසන ශරීර සුවතා වැඩ සටහන්

පාසලේ දිනපතා පැවැත්විය යුතු උදෑසන ශරීර සුවතා වැඩ සටහන වෙනුවෙන් විනාඩි 15 ක කාලයක් පාසල් කාල සටහනෙන් වෙන් කර දී ඇත. එහෙත් බොහෝ පාසල් එම කාලය අදාල කාර්යය වෙනුවෙන් යොදා නොගන්නා බව අමාත්‍යාංශය වෙත වාර්තා වී ඇත. එහෙයින් පාසල් කාල සටහනේ ප්‍රථම විනාඩි 15 ශරීර සුවතා වැඩ සටහන සඳහා පමණක් යොදා ගන්නා ලෙස මෙයින් අවධාරණය කරමි. පාසල් ශරීර සුවතා වැඩ සටහන වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් 2002 මැයි 15 දින නිකුත් කර ඇති අංක 2/ශා.අ.ක්‍රී/2/137 දරණ චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාර එම වැඩසටහන දිවයිනේ සෑම පාසලකටම ගුරු මණ්ඩලයේ දායකත්වය ඇතිව දිනපතා ක්‍රියාත්මක කළ යුතු බව සලකන්න.

පාසල් ශරීර සුවතා වැඩ සටහන වෙනුවෙන් ව්‍යායාම් මාලා 4 ක් අඩංගු කර ගුරු අත්පොතක්, සංගීත කැසට් පටියක් අමාත්‍යාංශය මගින් සෑම පාසලකටම ලබා දී ඇති අතර එම ව්‍යායාම් මාලා හතරම මේ වන විට ඔබ ප්‍රදේශයේ පාසල්වල සිසුන් සඳහා පුහුණු කර ඇතැයි සිතමි. එසේ යම්කිසි ව්‍යායාම් මාලාවක් මග හැරී ඇත්නම් එය ගුරු අත්පොතේ දී ඇති උපදෙස් පිළිපදිමින් ක්‍රමවත්ව සිසුනට පුහුණු කරවීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන්න.

2006 ජුනි මස සිට තවත් ව්‍යායාම් මාලා 4 ක් පාසල් ශරීර සුවතා වැඩසටහන සඳහා එක් කිරීමට අමාත්‍යාංශය කටයුතු සම්පාදනය කර ඇත. එම ව්‍යායාම් මාලාවන් වේග රිද්මයකට අනුව නිර්මාණය කර ඇත. දැනට පාසල් වෙත ලබා දී ඇති ව්‍යායාම් මාලා හතර ක්‍රමානුකූලව සිසුනට පුහුණු කරවා තිබීම නව ව්‍යායාම් මාලා හැදෑරීමට රුකුලක් වනු ඇත.

එහෙයින් ඔබ පළාතේ සියළුම පාසල්වල උදෑසන ශරීර සුවතා වැඩ සටහන අනිවාර්යයෙන් කරවීම සඳහා අවශ්‍ය කටයුතු කරන මෙන් දන්වමි.

ආරියරත්න හේවගේ,
අධ්‍යාපන ලේකම්.

පිටපත් :

1. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ .. ..........................කලාපය
2. නි.අ.අ./ස.අ.අ. (ශා.අ.)

ඔබ කලාපයේ කොට්ඨාශයේ සෑම පාසලකම
මෙම වැඩ සටහන ක්‍රියාත්මක වීම අධීක්ෂණයෙන් අධීක්ෂණය
කර අවශ්‍ය උපදෙස් ලබා දීමටත්,වැඩ සටහන ක්‍රියාත්මක නොකරන
පාසල් වෙතොත් ඒවා මා වෙත වාර්තා කිරීම සඳහාත් කටයුතු
කරන්න.